සමාජ සමීක්ෂා, වෙළුම 1, කලාපය 1, පිටු අංක 33-47, 2015

සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රය
ISSN 2478-0472
http://www.socialaffair.org

# සමාජ සංවර්ධනය උදෙසා නායකත්වය, බලගැන්වීම සහ සහජීවනය

## (නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන පිළිබඳ විමසීමක්)

නන්දන විජේසිංහ*
සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

සරත්චන්ද්‍ර ගම්ලත්**
ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ඇකඩමිය, මෙල්බර්න් නුවර, ඕස්ට්‍රේලියාව

### හැඳින්වීම

නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන මේ වනවිට අදියර 3 ක් යටතේ ක්‍රියාත්මක වී ඇත. මෙම වැඩසටහන මඟින් ගැටුම් සිදුවූ සහ දුෂ්කර ප්‍රදේශවල විවිධ ජන කොටස්වලට අයත් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය හා උසස් පෙළ ඉගෙනුම් ලබන සිසු දරු දැරියන් තුළ ගැටුම් හා ත්‍රස්තවාදී ක්‍රියාවන් හේතුවෙන් හටගත් මානසික ආතතිය සමනය කිරීමට සහයවීමත්, අඩාල වී ඇති ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් බලගැන්වීමත් සිදුකෙරේ. ඊට අමතරව දශක කිපයක් තිස්සේ ඇතිවූ ගැටුම් හේතුවෙන් කඩාවැටී ඇති සමාජ පර්යාය නැවත ගොඩ නැංවීමේ අඩිතාලම සකස් කිරීමත්, අන්තර් වාර්ගික හා සාමාජීය සහජීවනය ගොඩනංවා තිරසාර සාමය තහවුරු කිරීමත් වැඩසටහනෙන් දීර්ඝ කාලිනව අරමුණු කෙරේ. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන උපක්‍රමය වනුයේ යහපත්, විනයගරුක හා බලගැන්වූ ශිෂ්‍ය නායකත්වයක් පුහුණු කර ඔවුන් විපර්යකාරකයන් (Change Agents) ලෙස මුදාහැර, ප්‍රජාව තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමයි. සමස්ත වැඩසටහන බලගැන්වීම, සහජීවනය සහ නායකත්ව වර්ධනය යන සංකල්ප මත පදනම්වී ඇත.

මෙම ජාතික වැඩසටහන දැනට වසර හතරක කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන අතර, මේ වනවිට ඉතා සාර්ථක ප්‍රතිඵලයන් විද්‍යමාන වෙමින් පවතී. මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වනුයේ මේ වනවිට ලබා ඇති ප්‍රගතියද සමාලෝචනය කරමින්, වැඩසටහන හරහා සිදුවිය හැකි ප්‍රජා විපර්යාසය, පිළිබඳ විමසීමක යෙදීමයි.

මෙම විග්‍රහය සඳහා දත්ත ලබාගන්නා ලද මුලාශ්‍ර කිහිපයකි. ක්‍ෂෙත්‍රයට අදාළ සාහිත්‍ය පරිශීලනය පළමුවෙන් සිදුකරන ලදී. ලිපි ලේඛන, පොත්පත්, මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනට අදාළ ලේඛන, පත්‍රිකා, පුවත්පත් වාර්තා සහ

*කර්තෘ විද්‍යුත් ලිපිනය: nandanaw@pdn.ac.lk
**කර්තෘ විද්‍යුත් ලිපිනය: Sarath.gamlath@gmail.com
© සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

විද්‍යුත් හා මුද්‍රිත වාර්තා වැඩසටහන් පරිශීලනය කරන ලදී. දෙවනුව මෙම ජාතික වැඩසටහනේ පුරෝගාමීන්, සම්පත්දායකයින්, කළමනාකරුවන්, සංවිධායකයින් සහ ප්‍රතිලාභීන් සමග සම්මුඛ සාකච්ඡා මගින් ඔවුන්ගේ අත්දැකීම් ලබාගන්නා ලදී. එසේම වැඩසටහන පිළිබඳ ලේඛකයින්ගේ පෞද්ගලික අත්දැකීම් සහ නිරීක්ෂණයන් ද මෙම ලිපියේ විශ්ලේෂණය සඳහා දායක විය.

මෙම ලිපිය ප්‍රධාන කොටස් හතරකින් යුක්තය. පළමුව නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන පිළිබඳ හැඳින්වීමක් ඇතුළත් වේ. දෙවනුව ජාතික වැඩසටහනින් ප්‍රධාන සංකල්ප පැහැදිලි කෙරේ. බලගැන්වීම, අන්තර් ජනවාර්ගික හා ආගමික සහජීවනය සහ නායකත්ව කුසලතා වඩාත් වර්ධනය මෙහිලා වැදගත්ය. ලිපියේ තුන්වන කොටසින් නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනේ අවසාන වැදගත් පරමාර්ථයක් වන මෙම ජාතික වැඩසටහනේ හිමිකාරීත්වය ප්‍රතිලාභීන්ට ලැබීම පිළිබඳ සඳහන් කෙරෙන අතර අවසානයේදී නිගමනය ඇතුළත් කෙරේ.

## නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන

නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන පිළිබඳ සංකල්පය වර්ෂ 2006 කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ සිදුවූ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයත් සමග සනිටුහන්වේ. ප්‍රහාරයෙන් හිංසාවට පත් පුද්ගලයින් සහ පවුල් හමුවීමෙන් අනතුරුව ජනාධිපති තුමා මෙම සංකල්පය ඉදිරිපත් කොට එය ක්‍රියාත්මක කරන්නැයි උපදෙස් දෙනු ලැබීය[1]. ඒ අනුව ප්‍රථමයෙන් ගැටුම් පවතින ප්‍රදේශවල විවිධ දුෂ්කරතාවලට මුහුණ පා ඇති සාමාන්‍ය පෙළ හා උසස් පෙළ හදාරමින් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආවරණය කරමින් ගැටුම් හේතුවෙන් ඔවුන් තුළ ඇතිවී ඇති මානසික ආතතිය සමනය කිරීමට සහාය වීමත් අඩාල වී ඇති අධ්‍යාපන කටයුතු සඳහා ඔවුන් දිරි ගන්වා උනන්දු කරවීමත් අරමුණු කරගෙන වැඩසටහන සැලසුම් කර දියත් කරන ලදී. මේ වන විට වැඩසටහන කැබිතිගොල්ලෑව, මැදවච්චිය, පදවි ශ්‍රී පුර, වව්නියාව, ත්‍රිකුණාමලය, ගෝමරන්කඩවල, වැලිඔය, සම්පත් නුවර, සාම්පූර්, තෝපූර්, පුල්මුඩේ, සේරුනුවර, අම්පාර, මඩකලපුව, පොළොන්නරුව, මන්නාරම ආදී ගැටුම් පැවති හා දුෂ්කර ප්‍රදේශවල සිසුන් ආවරණය කර, යම් යම් සහන කටයුතු ඔවුන් සඳහා ක්‍රියාත්මක කර, ඔවුන් වෙත ඒවායේ ප්‍රතිලාභ ලැබීමට සළස්වා, ඔවුන් ක්‍රියාකාරී ලෙස වැඩසටහනට සම්බන්ධ කර, සාර්ථක ප්‍රගතියක් විද්‍යමාන කරමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

## නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහනේ ප්‍රධාන අරමුණ

නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහන කෙටි කාලීන හා දීර්ඝ කාලීන අරමුණු කිපයකින් සමන්විත වේ. දීර්ඝකාලිනව, පුළුල් වශයෙන් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තුවන අරමුණ වනුයේ, ''දශක කිපයක් තිස්සේ පැවති ගැටුම් හේතුවෙන් අසංවිධාන වූ ලක්ෂණ විද්‍යමාන කරමින් පවතින ශ්‍රී ලාංකික සමාජයේ සංවර්ධනය නැවත ගොඩනංවා සංවිධිත කිරීමේ අඩිතාලම සකස්කර, ගැටුම් තුළින් පැන නැගුණ අයහපත් සමාජ සාධකයන් හේතුවෙන්, විවිධ විෂමතාවයන් හා විරසකයන් විද්‍යමාන කරන ශ්‍රී ලාංකික ප්‍රජා කොටස් අතර ''අන්තර් ප්‍රජා සහජීවනය'' තිරසාර වශයෙන් ගොඩනංවා, සාමකාමී, සාමූහික ශ්‍රී ලාංකික ප්‍රජාවක් ගොඩනැංවීමත්, එමගින් සර්ව සම්පූර්ණවූ සමාජ සංවර්ධනයක් අයත් කර ගැනීමේ සමස්ත ජාතික ක්‍රියාවලියට දායක වීමයි''.

දශක කිපයක් තිස්සේ පැවති ගැටුම් හේතු කොට ගෙන ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ප්‍රජා කොටස් අතර ඔවුනොවුන් කෙරෙහි

1 නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහන 2006 වර්ෂයේ සිදුවූ කැබිතිගොල්ලෑව බෝම්බ ප්‍රහාරයෙන් අවතැන් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් යටතේ ආරම්භකොට අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙන්නකි. මෙම ව්‍යාපෘතිය මගින් ගැටුම් පැවතුන සහ දුෂ්කර ප්‍රදේශවල විවිධ ජන වර්ගවලට අයත් අ.පො.ස සාමාන්‍ය පෙළ, අ.පො.ස උසස් පෙළ ඉගෙනුම ලබන සිසු දරු දැරියන් තුළ ත්‍රස්තවාදයෙන් හටගත් මානසික ආතතිය සමනය කිරීමට සහය වීමත් ත්‍රස්තවාදයෙන් අඩාල වී ඇති ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු උදෙසා සිසුන් බල ගැන්වීමත් සිදුකෙරේ. මේ වන විට මෙම ව්‍යාපෘතියෙන් කැබිතිගොල්ලෑව, මැදවච්චිය, පදවි ශ්‍රී පුර, වවුනියාව, ත්‍රිකුණාමලය, ගෝමරන්කඩවල, වැලිඔය, සම්පත් නුවර, සාම්පූර්, තෝපූර්, පුල්මුඩේල සේරුනුවරල අම්පාර, මඩකලපුව, පොළොන්නරුව, මන්නාරම ආදි ගැටුම් පැවතුන හා දුෂ්කර ප්‍රදේශ ගණනාවක සිසුන් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. (PSDA/SD/HO1 2006-2010)

**වගු අංක 1: නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහනේ අරමුණු, උපක්‍රම හා මිනිය හැකි ප්‍රතිඵල**

| පුළුල් අරමුණ | කෙටි හා මධ්‍ය කාලීන අරමුණු | උපක්‍රමයන් | ප්‍රතිඵල |
|---|---|---|---|
| අන්තර් ප්‍රජා සහජීවනය ස්ථිරසාරයෙන් ගොඩනංවා සාමකාමී සාමූහික ශ්‍රී ලාංකික ප්‍රජාවක් නිර්මාණය කර සර්ව සම්පූර්ණ සමාජ සංවර්ධනයක් ගොඩ නැංවීමේ සමස්ත ක්‍රියාවලියට දායකවීම. | 1. ජාති, ආගම්, පංතිභේද හරහා ගොඩනැගී ඇති අයහපත් සමාජ සම්බන්ධතාවන් හඳුනාග ැනීම හා සමාජ සංවර්ධනයට එමගින් සිදුවන බාධාවන් පිළිබඳ ශිෂ්‍ය තරුණ තරුණියන් අතර අවබෝධයක් ඇති කිරීම. | ප්‍රාදේශිය (කළාප, දිස්ත්‍රික්ක හා පළාත්) මට්ටමේ වැඩමුළු මගින්<br>1. තොරතුරු සැපයීම<br>2. සාකච්ඡාවන් ඇති කිරීම<br>3. අදහස් හුවමාරු කර ගැනීම<br>4. දැනුම වර්ධන දේශන<br>5. විවිධ ශිෂ්‍ය අන්තර් ක්‍රියාකාරකම්<br>6. කුසලතා එළිදැක්වීම තුළින් අදහස් හා ආකල්ප දිරිමත් කිරීම හා හුවමාරුව | 1. අගැයීම්වලින් එළිදැක්වූ අදහස්.<br>2. ආකල්ප වෙනස්වීම් පිළිබිඹු කෙරෙන ප්‍රකාශ<br>3. වැඩසටහන් පිළිබඳ විවේචන හා අදහස් උදහස්<br>4. විවිධ නිර්මාණ (චිත්‍ර, කලා, නැටුම්, සඟරා, වාර්තා වැඩසටහන්) හා ඒවායේ ඇතුළත් අදහස් හා ආකල්ප<br>5. අන්තර් සහජීවන ක්‍රියාකාරකම් (විවිධ සංස්කෘතික උත්සවවල සහභාගීත්වය, ක්‍රීඩා සහ පරිසර කටයුතු) |
| | 2. විවිධ ප්‍රජා කණ්ඩායම් බෙදී වෙන්වී ස්වාධීන වූ අනන්‍යතාවයන් ගොඩනංවාගෙන ඇතත්, ඒ සියල්ලෙහි පදනම වියයුත්තේ ''ශ්‍රී ලාංකික අනන්‍යතාවය'' සහිත සමාජයක මූලික සම්බන්ධතා මත ගොඩනැගුණ සාමූහික ප්‍රජාවක්ය යන අවබෝධය ශිෂ්‍ය තරුණ තරුණියන් අතර ස්ථාපිත කිරීම. | 1. දැනුම වර්ධනය කරන දේශන<br>2. අවබෝධතා වර්ධන පිළිබඳ තොරතුරු<br>3. ප්‍රජා අන්තර් ක්‍රියා සහිත ක්‍රියාකාරකම්<br>4. ප්‍රදර්ශන<br>5. අන්තර් - ප්‍රජා වැඩමුළු<br>6. පාසල් මට්ටමේ වැඩමුළු සාකච්ඡා හා සංවාද | 1. වැඩසටහන් අගැයීමේ ප්‍රතිඵල<br>2. ශිෂ්‍ය අදහස්<br>3. ආකල්ප වෙනස්කම් පිළිබිඹු කෙරෙන ප්‍රකාශනයන්<br>4. අන්තර් ප්‍රජා මිතුරු සම්බන්ධතා |
| | 3. නිවැරදි පණිවිඩ හා තොරතුරු ලබාදීමෙන් පෞරුෂ වර්ධන කාලය තුළ සිටින ශිෂ්‍ය තරුණ තරුණියන් අතර නිවැරදි, යහපත් හා ප්‍රගතිගාමී චර්යාවන්ට පදනම් වන අදහස් හා ආකල්ප ඇති කිරීම. | 1. පාසල් මට්ටමෙන් සංවාද හා සාකච්ඡා<br>2. මනෝ විද්‍යා හා ප්‍රජා සෞඛ්‍ය වැඩමුළු<br>3. උපදේශාත්මක සැසිවාරයන්<br>4. දැනුම වර්ධන දේශන<br>5. කුසලතා අදහස් උදහස් ආකල්ප ඉදිරිපත් කිරීමට අවස්ථාවන්<br>6. තොරතුරු සැපයීම | 1. වැඩසටහන් හා සැසිවාරයන් අගැයීම් ප්‍රතිඵල<br>2. වැඩමුළු හා සැසිවාර ප්‍රමාණයෙන්<br>3. ඉදිරිපත්වන අදහස් හා ආකල්ප<br>4. බලගැන්වීම හා ස්වාධීන පෞරුෂ පිළිබිඹු කරන අදහස්<br>5. එක් එක් සංස්කෘතීන්ට අයත් ජන සාහිත්‍ය පරිශීලනය හා බහුවිධ සංස්කෘතික අත්දැකීම් ලබා ගැනීමට ක්ෂේත්‍ර චාරිකා |

| පුළුල් අරමුණ | කෙටි හා මධ්‍ය කාලීන අරමුණු | උපක්‍රමයන් | ප්‍රතිඵල |
| --- | --- | --- | --- |
| | 4. සමාජ සංවර්ධනයේ පණිවිඩය ගෙන යාමට කැපවූ තරුණ ශිෂ්‍ය නායකයන් පුහුණුකර ඔවුන් ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රජාවෙන් ප්‍රජාවට යොමුකළ හැකි විපර්ය කාරකයන් (Change agents) හා සාමදූතයන් (Peace Messengers) ලෙසට සකස් කිරීම | 1. පාසැල් මට්ටමේ වැඩමුළු<br>2. නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය ශිෂ්‍ය සමාජ<br>3. සිසු දිරිය සමාජ තුළින් නායකත්ව ලක්‍ෂණ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් මතුවන ආකාරයේ ක්‍රියා ක්‍රියාකාරකම්<br>4. ප්‍රාදේශිය (කලාප, දිස්ත්‍රික් හා පළාත්) මට්ටමේ අන්තර් සිසු දිරිය සමාජ වැඩමුළු<br>5. ජාතික මට්ටමේ අන්තර් සිසු දිරිය සමාජ වැඩමුළු<br>6. අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් හා ක්‍රියාකාරකම් | 1. පාසැල් වැඩමුළු ප්‍රමාණය<br>2. සිසු දිරිය සමාජ ප්‍රමාණය<br>3. වැඩසටහන් ඇගයීම් ප්‍රතිඵල<br>4. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අදහස් උදහස්<br>5. සිසු දිරිය සමාජ මගින් පාසැල් මට්ටමේ පවත්වන ලද වැඩමුළු ප්‍රමාණය |
| | 5. යම් යම් ආර්ථික ආධාරයන් අවශ්‍ය ශිෂ්‍ය තරුණ තරුණියන් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා හැකි ආකාරයෙන් උපකාරිවීම සහ ඒවා සපුරාලීමට උපකාරි විය හැකි විවිධ මූලාශ්‍රයන් වෙත ඔවුන් යොමු කිරීම | 1. සම්මුඛ පරීක්‍ෂණ හා සාකච්ඡා<br>2. ගුරු හා ප්‍රජා නායකයින්ගේ තොරතුරු ලබාගැනීම<br>3. නිරීක්‍ෂණය හා ඒමත පදනම් වූ තොරතුරු සොයා බැලීමේ සාකච්ඡා<br>4. ආගමික නායකයින්, මහජන නියෝජිතයන්, ප්‍රජා සාමාජිකයින්, ප්‍රජා නායකයින්, රාජ්‍ය හා රාජ්‍ය නොවන වෘත්තිකයින්ගේ, නිර්දේශ කිරීම් හා ඒවා සම්බන්ධිකරණය<br>5. ක්‍රියාවට නැංවිය හැකි සුළු පරිමාණයේ ආර්ථිකමය ආධාර වැඩසටහන්<br>6. ආර්ථිකමය වශයෙන් ආධාර කළ හැකි බාහිර මූලාශ්‍ර පිළිබඳ දත්ත පවත්වාගෙන යාම<br>7. බාහිර ආධාර මූලාශ්‍රයනට ආධාර ලැබිය යුත්තන් සම්බන්ධ කිරීම, ආධාර සංවිධානය කිරීම හා ඒවා සම්බන්ධිකරණය කිරීම | 1. හඳුනාගත් ආධාරලාභි ශිෂ්‍යයින් ප්‍රමාණය හා ප්‍රතිඵල<br>2. සංවිධානය කර සම්බන්ධිකරණය කරනු ලබන ආධාර වැඩසටහන් ප්‍රමාණය<br>3. ආධාර දිය හැකි බාහිර මූලාශ්‍ර දත්ත ලැයිස්තුව<br>4. බාහිර ආධාර සැපයිය හැකි ජාතික හා ජාත්‍යන්තර මූලාශ්‍රයන් වෙත සමාජ ආර්ථික ආධාර ඉල්ලා ඉදිරිපත් කරන ලද යෝජනා ප්‍රමාණය හා ඒවායේ ප්‍රතිඵල<br>5. ජීවන නිපුනතා (Livelihood-skills) පුහුණුව |

| පුළුල් අරමුණ | කෙටි හා මධ්‍ය කාලින අරමුණු | උපක්‍රමයන් | ප්‍රතිඵල |
|---|---|---|---|
| | 6. ශිෂ්‍ය තරුණ තරුණියන් අතර විවිධ විශේෂිත වූ සහජ හා ''ඉගනගත්' කුසලතා ඇති අය සඳහා ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ අවස්ථාවන් සලසා දී ඒවා වැඩි දියුණුකර ඔවුන්ගේ ප්‍රගතිය සඳහා ආධාර හා පහසුකම් සළසාදීම | 1. සිසු දිරිය සමාජ වැඩසටහන් තුළින් සහජ හා ''නිපුණ වූ'' කුසලතා ඇති අයට මතුවිය හැකි අවස්ථාවන් සළසාදිම සඳහා වැඩසටහන්, ජාතික හා ජාත්‍යන්තර ක්‍රියාකාරකම් ආදිය සංවිධානය කිරීම<br>2. ප්‍රාදේශිය මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ''සිසු දිරිය සමාජ'' තුළින් මතුවූ කුසලතා සඳහා එහිදී අවස්ථාවන් සළසාදීමට කටයුතු සංවිධානය කිරීම<br>3. ජාතික මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම හා සිසු දිරිය සමාජ හා ප්‍රාදේශිය මට්ටමේ වැඩමුළු හරහා මතුවූ කුසලතා සඳහා එහිදී අවස්ථාවන් සලසාදීමට කටයුතු කිරීම.<br>4. අතිවිශේෂිත වූ කුසලතා සඳහා විශේෂිත ආධාර වැඩසටහන් බාහිර සම්පත්දායකයින්ද සහභාගිකරගෙන සංවිධානය කිරීම හා ඒවා සම්බන්ධීකරණය කිරීම | 1. හඳුනාගත් කුසලතා සහිත ශිෂ්‍යයින් සහ හඳුනාගත් කුසලතාවන් ප්‍රමාණය<br>2. කුසලතා ප්‍රදර්ශනය හා වර්ධනය සඳහා සිසු සමාජ මට්ටමේ වැඩසටහන් ප්‍රමාණය<br>3. ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් ප්‍රමාණය හා මතුවූ කුසලතාවන් පිළිබඳ වාර්තා<br>4. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩසටහන් හා වාර්තා<br>5. විශේෂිත කුසලතා සහිත සිසුන් හා ආධාර වැඩසටහන් පිළිබඳ වාර්තා<br>6. කුසලතා වර්ධනය සඳහා බාහිර මුලාශ්‍රවල උපකාර හා සම්බන්ධතා පිළිබඳ වාර්තා<br>7. වැඩසටහන් අගැයීම් සමීක්ෂණ ප්‍රතිඵල<br>8. ශිෂ්‍ය අදහස් උදහස් හා අකල්ප |

වෛරය අවිශ්වාසය හා සැක-බිය පැතිර පවතී. එම නිසා විවිධ ප්‍රජා කොටස් අතර, ඔවුනොවුන්ගේ සමාජ සංස්කෘතික අනන්‍යතාවයන් පවත්වාගන්නා අතරම, ඔවුනොවුන් කෙරෙහි ගෞරවය දැක්වීමේ ආකල්ප ස්ථාපනය කර සමුහිකවූ එක් ශ්‍රී ලාංකික ප්‍රජාවක් නැවත ගොඩනැංවීමට ශක්තිමත්වූ සමාජ සංවර්ධනයක් ඇති කිරීමේ අඩිතාලම සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී විවිධ ප්‍රජා කොටස් අතර, පවතින ස්වාධීනවූ සමාජ සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔවුනොවුන් අතර ඇති කිරීම ඉතා වැදගත්වන අතර එමගින් ත්‍රස්තවාදී ක්‍රියා මගින් බලයෙන් පවත්වාගෙන ගිය, සමාජ විසංවිධානයට හේතුවූ ''අනවබෝධය'' තුරන් කිරීම සමාජ සංවිධානය යළි ස්ථාපිත කිරීමේ කාර්යයේදී වැදගත්වේ.


වැඩසටහනේ දීර්ඝ කාලීන අරමුණු සාක්‍ෂාත් කර ගැනීම සදහා සැළසුම් කරන ලද කෙටිකාලීනව හා මධ්‍යකාලීනව ක්‍රියාත්මක කිරීමට යොමුවූ අරමුණු කිපයක් පවතී. සියළුම කෙටිකාලින හා මධ්‍යකාලින ඇරමුණු සාක්‍ෂාත් කරගැනීම තුළින් සමස්ත වැඩසටහන පදනම්වී ඇති දීර්ඝ කාලීන අරමුණු සාක්‍ෂාත් කරගැනිම අදහස් කෙරේ.

නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනේ අරමුණු මෙන්ම ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා සැළසුම් කරන ලද උපක්‍රම සහ මේ වන විට ලබා ඇති සහ ඉදිරියේදී ඇතිවිය හැකි ප්‍රතිඵල (Expected Outcomes) දැක්වෙන සටහනක් පහත ඉදිරිපත් කෙරේ.

## නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන ක්‍රියාත්මකවන ආකාරය හා ප්‍රතිඵල

උතුරු, නැගෙනහිර හා උතුරු මැද පළාත්හි අධ්‍යාපන කලාපවලින් තෝරාගත් මහා විද්‍යාලයන් කිපයක් වැඩසටහන මඟින් ආවරණය කෙරේ. වසර තුනහමාරක කාලය තුළ මසකට වරක් සතියක වැඩමුළුවක් කොළඹ, මහනුවර වැනි ප්‍රදේශවල පවත්වන ලදී. එක් වැඩමුළුවකට සිංහල, දෙමළ හා මුස්ලිම් පාසල් තුනකින් තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 75 - 100 අතර ප්‍රමාණයක් සහභාගි විය. පළාත් තුනක බොහෝ දිස්ත්‍රික්කයන් කේන්ද්‍රකොටගෙන සිංහල, ද්‍රවිඩ හා මුස්ලිම් ශිෂ්‍යයින් නියෝජනයවන පරිදි ප්‍රාදේශිය මට්ටමින් සංවිධානය කරන ලද වැඩමුළු ගණනාවක් මේ වන විටත් පවත්වා ඇති අතර 2008 වර්ෂයේ සිට නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ ආරම්භ කිරීම වැඩසටහනේ දෙවන අදියරේදී සිදුවිය. වැඩසටහනෙහි තෙවන අදියර යටතේ වවුනියාව දිස්ත්‍රික්කයේ දකුණු හා උතුරු අධ්‍යාපන කලාපයන් නියෝජනය කරනු ලබන පාසල්වල ''සිසු දිරිය සමාජ'' පිහිටුවමින් පවතින අතර එම කටයුතු මන්නාරම දිස්ත්‍රික්කය සහ උතුරු පළාතේ පිහිටි අනිකුත් දිස්ත්‍රික්ක දක්වා ව්‍යාප්ත කරවීමට සැළසුම් සකස් වී ඇත.

රූප සටහන 1




සමස්ත වැඩසටහනට පදනම්වී ඇති මූලධර්ම සැලකිල්ලට ගනිමින් ජාතික වැඩසටහනේ ක්‍රියාකාරීත්වය හා ඒවා ක්‍රියාත්මකවන සමාජ ස්ථරය, ඒවායෙන් බලාපොරොත්තුවන පුළුල් ප්‍රතිඵලයන් හා අවසානයේ සමස්ත සමාජ දේහය හරහා එය ව්‍යාප්ත විය හැකි ආකාරය ඉහත රූප සටහනින් සංක්ෂිප්තව දැක්වේ. සමාජයේ ප්‍රජා පහළ ස්ථරයන් හරහා ක්‍රියාත්මක වන වැඩසටහනේ ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ප්‍රතිඵලයන් සමාජයේ ඉහළ ස්ථරයන් හරහා සිදුවන උඩුකුරු (upward spread effects) ව්‍යාප්ත වීම තුළින් ගොඩනැගෙන සහජීවනය හා ඒකාබද්ධතාවය මත පදනම්වූ දායකත්වයක් දේශයේ සමස්ත සමාජ සංවර්ධන ක්‍රියාවලියට සිදුකෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ඒකාබද්ධතාවයේ පාදක ව්‍යුහය ලෙස ප්‍රජාව (Community)

### ප්‍රජාව යනු කුමක්ද? එහි ලක්ෂණ

විශේෂයෙන්ම ප්‍රජාව යන සමාජ ඒකකය තුළ ක්‍රියාත්මකවන පුද්ගල අන්තර් සම්බන්ධතා, ඒනිසාම ප්‍රජාව යන්න විශේෂිත සමාජ ඒකකයක් ලෙස හඳුනාගත හැකි ආකාරය Tonnies (1963) ප්‍රථමයෙන්ම මනාව විස්තර කරන ලද අතර, එය ඉමහත් අවධානයට, විශ්ලේෂණයන්ට අර්ථකථනයන්ට තවමත් භාජනය වෙමින් පවතී (Anderson Kasperson, 2000).

Drawing on the work of Ferdinand Tonnies in “Community and Society” Banman (2007) describes the pre-industrial community as one that wascharacterized by understandings and unquestioned values shared by all its members.

එහෙත් ප්‍රජා සංවර්ධනය (Community Development) පිළිබඳ මෑත කාලීන ලියවිලිවල ප්‍රජාව සහ එහි ලක්ෂණයන් පිළිබඳවත්, සමකාලීන සමාජයේ ‘ප්‍රජාව’ පිළිබඳ සම්භාව්‍ය සමාජ න්‍යායේ (Classical Social Theory) ඉදිරිපත් කර ඇති ආකාරයේ අදහස (Anderson & Kasperson, 2000) බිඳවැටීමට ඇති ඉඩකඩ පිළිබඳවත් කරුණු, ඉතා මැනවින් ඉදිරිපත්වී ඇත (Hughes,P.et.al, 2007; Banman, 2001; Ife & Tesoriero, 2006; Kenny, 2006). ගෝලියකරණයත්, එහි සීඝ්‍ර ව්‍යාප්තියත් එම ව්‍යාපෘතිය වේගවත් කිරීමට ඉතාම මෑත කාලයේ තුඩුදී ඇති (අන්තර් ජාලය ඇතුළු) විද්‍යුත් සන්නිවේදනය හා අධිවේගී ප්‍රවාහනයත් හේතුවෙන් ‘ප්‍රජාව’ යන මානව ඒකකය විනාශවීම සඳහා අවසාන මාරාන්තික ප්‍රහාරය මේ වන විටත් එල්ලවී ඇතැයි ඇතැම් විද්වතුන් විශ්වාස කෙරේ (Bauman, 2001). කිසිවිටකත් ප්‍රශ්න නොකර බෙදා හදාගන්නා ලද Tonnies විස්තර කරන ලද ආකාරයේ, අන්‍යෝන්‍ය සුහද සම්බන්ධතාවය මත පදනම්වූ ‘‘ප්‍රජාව’’ සහ එහි අභිංසකවූ පැවැත්ම, මානව ඉතිහාසයේ සංකේතයක් පමණක් ලෙසට නූතන සමාජයේදී සීමා කළ හැකි බව Bauman (2001) විශ්වාස කරයි.

ගැටුමට තුඩුදිය හැකි අගතිගාමීවූ පුද්ගලිකත්වයේ අහිසි ප්‍රතිවිපාක පුද්ගලයාගේ සීමාව පසුකොට ප්‍රජා සීමාවන් දක්වා ව්‍යාප්තවී ඇත. එබැවින් කුඩා කුඩා ප්‍රජා කොටස් තමන්ටම ආවේණිකවූ, තමන්ගේම යයි පමණක් හඳුනාගනු ලබන අනන්‍යතාවයන් මත පදනම්වූ, ප්‍රජා කොටස් සඳහා වැටකඩොළු සකස්කර ගනිමින්, සමස්ත සමාජයෙන් විසන්ධි වීමේ ප්‍රවණතාවක් ඇතැම් සමාජවලින් විද්‍යමාන වේ. ඒ අනුව ඇතැමුන්ගේ අදහස වනුයේ, සමාජ පර්යායේ පදනම වූ, සියළු සාමාජිකයින් විසින් කිසිවිටකත් ප්‍රශ්න නොකරන ලද හා පොදුවේ බෙදා හදා ගන්නා ලද ලක්ෂණයන්ගෙන් යුක්ත, බොහෝ අවස්ථාවලදී වචනයෙන් ප්‍රකාශකළ නොහැකි, සමාජ සම්බන්ධතාවලින් යුක්ත ප්‍රජාවන් ක්‍රමයෙන් මානව සමාජයෙන් වියැකී යන බවයි (Bunman, 2001). මෙයට ප්‍රධානතම හේතුව ලෙස ඔවුන් අදහස් කරනුයේ අන්තගාමිවූ පුද්ගලිකත්වයේ අදහස හා ආකල්ප,සමස්ත සමාජ දේහය හරහා මානව සමාජයේ පැවැත්මටද අවධානමක් ඇති කරමින් විකෘතිවූ, නූතන ලිබරල්වාදී අදහස් උදහස් හා ආකල්ප හරහා වේගයෙන් ව්‍යාප්තවී යාමයි (Ife & Tesoriero, 2006 ;Kenny, 2006; Korton, 1990 & 1995; Isbister, 1991). පරිසරය, සාමූහිකත්වය, සහජීවනය හා ඒකාබද්ධතාවය පිළිබඳ ඇගයීම් හා සාරධර්ම විනාශවීමේ පිරිවැයක් සහිතව ලබාගන්නා ආර්ථික වර්ධනයක් (Econamic growth) පමණක්ම මත පදනම්වූ සමාජ සංවර්ධනයක් සාක්ෂාත්කර ගත හැකිය අදහස සමස්ත සමාජය හරහා ව්‍යාප්ත වෙමින් පවතී.

එසේ වුවත් ‘‘ප්‍රජාව’’ යන මානව ඒකකය නොමැතිව පවත්වාගෙන යා හැකි ජීවිතයක පවතින අසීමිත අඩුපාඩු, අසම්පූර්ණභාවය හා අතෘප්තිය පිළිබඳ වර්තමාන සමාජයේ පුද්ගලයා විසින් පෙර නොවූ වීරූ ආකාරයෙන් සාක්ෂාත් කරගෙන ඇතිය අදහසද සඳහන් වේ (Etzioni, 1993). ඒ නිසාම සාමූහිකත්වය, අනන්‍යෝන්‍යය සුහදතාවය හා උපකාරය, බෙදාහදා ගැනීම මත පදනම්වූ ප්‍රජාවක් ගොඩනැංවීමේ අසීමිත ප්‍රයත්නයක් ලෝකයේ බෙහෝමයක්ම

සමාජවලින් වර්තමානයේ විද්‍යාමාන වන බවද පෙනේ (Etzioni, 1995).

ප්‍රජා සංවර්ධනය පිළිබඳ ලියා ඇති බොහෝමයක් දෙනා තවමත් පිළිගනු ලබන හා එකඟතාවයකට එළඹෙන එක් කරුණක් ඇත. ප්‍රජාව යන ඒකකය නූතන සමාජයේ වියැකී යමින් පැවතියද, එහිදී ලැබිය හැකි අනුවේදනීයවූ අත්දැකීමත්, සියළුම කුඩා ප්‍රජාවන්ට සහජීවනයෙන් පැවතිය හැකි, ඔවුන් අතර අන්තර් හා ආන්තර (Inter & Intra) වශයෙන් ඒකාබද්ධතාවය ගොඩනගනු ලබන, ඔවුන් විසින්ම, ප්‍රශ්න කිරීමකින් තොරව, සාමූහිකව බෙදාහදා ගනු ලබන සමාජ මූලිකාංග සමාජයේ තවමත් පවතින බවයි. ඒවා ප්‍රජාවේ සියළුම සාමාජිකයින් එකට එකතු කරවනු ලබන, සහජීවනය ඒකාබද්ධතාවය හා සාමුහිකත්වය මත පදනම්වූ ප්‍රජාවක් ගොඩනැංවිය හැකි ''අනුවේදනාත්මක බැඳීම් '' බවට යළි පත්කළ හැකි බවයි.

අපේක්ෂා භංගත්වයකට පත්විය යුතු නැත. සියළුම සමාජීය, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතිකවූ මානව ක්‍රියාකාරකම් හා ප්‍රයත්නයන්හි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ, සියළුම දෙනා, තමන්ගේම යහජීවනය (Willbeing) සඳහා ප්‍රතිලාභ ලබන සමාජ සංවර්ධනයක් අත්කර ගැනීමයි (Karliner, 2000; Midglay, 1995). නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහන, එවැන්නකට යොමුවී ඇත. පරිසරය හා ඒකාබද්ධවූ සහජීවනයෙන් යුක්ත, සාමුහික ප්‍රජාවක් ගොඩනැගීමට තුඩු දෙන ප්‍රජාවේම ක්‍රියාකාරී සම්බන්ධය හා දායකත්වය සහිත, ප්‍රජාව තුළින්ම පැන නැගුණ ප්‍රජා සංවර්ධනයක් අයත් කරගැනීමත්, එය සියළුම ප්‍රජාවන් හරහා තිරස්ව මෙන්ම සිරස්ව ව්‍යාප්තවී සමස්ත සමාජ සංවර්ධනය දක්වා විහිදෙනු ඇතැයි එය අපේක්ෂා කෙරේ (Wijesinghe, 2006).

### නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ හා බලගැන්වීම (Empowerment)

ක්‍රියාකාරී කුඩා ප්‍රජා සිසු සමාජ දාමයක් ගොඩනැංවීම නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනින් කෙරේ. ඒකාබද්ධතාවය, සහජීවනය, බෙදාහදා ගැනීමේ ආකල්පය යන ඇගයීම් හා සාරධර්මවලින් ඒවා පරිපූර්ණ වේ. ඒ අනුව බලගැන්වීම තුළින් තමන්ගේ අනන්‍යතාවය හා පෞරුෂ ශක්තිය හඳුනාගත හැකි, තමන්ගේ ස්වාධීන චින්තනය තමාගේ මෙන්ම අන්‍යන්ගේද යහජීවනය සඳහා භාවිත කරීමේ හැකියාවෙන් යුක්ත පුද්ගලයන් සහිත ප්‍රජාවක් ගොඩනැගේ. එම ප්‍රජාවන් එකිනෙකා බද්ධවන අතර, ක්‍රියාවලියට එක් සමාජ සංවර්ධන සඳහා යොමුවී ඇති සමස්ත දේශීය ක්‍රියාවලියට ඉහළ මට්ටමින් දායකවීමේ නියතයෙන්ම පවතී.

සිසු දිරිය සමාජ, ප්‍රාදේශීය වැඩමුළු, ජාතික වැඩමුළු, අධ්‍යාපනික දේශන හා සංවාද, ශිෂ්‍ය සංවාද හා සාකච්ඡා, තොරතුරු සැසිවාරයන්, විවිධ ශිෂ්‍ය ක්‍රියාකාරකම් මෙන්ම ආර්ථික අපහසුතා මගහරවා ගැනීමේ වැඩපිළිවෙළවල්, කුසලතා වර්ධනයට සහය වීම් හා දිරිදීම් සිසු සමාජ මෙන් ජාතික වැඩසටහනේ අන්තර්ගතව ඇත. ශිෂ්‍ය තරුණ තරුණියන් පාදක කර ගනිමින් ප්‍රජා මට්ටමෙන් ක්‍රියාත්මක වන මේ සියළුම ක්‍රියාකාරකම් ''බලගන්වන ලද ස්වාධීන පෞරුෂයන්ගෙන් යුක්ත ක්‍රියාකාරී තරුණ නායකත්වයක්'' ගොඩනැංවීමේ නිලීන අරමුණ සාක්ෂාත් කර ගැන්ම උදෙසා යොමු වී ඇත.

''බලගැන්වූ ස්වාධීන පෞරුෂය'' යනුවෙන් අදහස් කරනුයේ පවතින සමස්ත සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ක්‍රියාවලීන් දෙස ස්වාධීන, සමතුලිත දෘෂ්ඨියකින් අගැයීමක් කර එමගින් විය යුත්තේ සහ නොවිය යුත්තේ කුමක්ද යන තීරණයට අගතියකින් තොරව එළඹීමේ හා දායකවීමේ හැකියාවයි. බලගැන්වුන පුද්ගලයා තමන්ගේ යහජීවනය සඳහා බාහිර පුද්ගල කණ්ඩායම් හා සමාජ බලවේගයන්ගෙන් එල්ලවන අනිසි බලපෑම් හා පීඩනයන්වලින් මිදී තීරණ ගැනීමේ හැකියාවක් ඇත්තෙකි. අවසානයේ ඒ තීරණ තුළින් අනන්‍යන්ගේ යහජීවනය සඳහා ක්‍රියාත්මක විය යුතු නිවැරදි සමාජ ක්‍රියාවලියන්ටද ඔවුනට දායක විය හැක. ප්‍රජා නායකත්වය බලගැන්වීම හා එමගින් ප්‍රජා බලගැන්වීම තුළින් යහපත් සමාජ විපර්යාසයන් නියතවශයෙන්ම සාක්ෂාත් කර ගත හැක (Kenny, 2006). එවැනි විපර්යාසයක් අයත්කරගත් අගතිගාමී අනිසි බලපෑම්වලට ලක්විය නොහැකි බලගැන්වූ ප්‍රජාව ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම්වූ

සමාජ සංවර්ධනයක් කරා යන දේශයේ සමස්ත ප්‍රයත්නයට අනිවාර්යෙන්ම දායකවනු ඇත. සිසු දිරිය සමාජ එවැනි දිශානතියකට යොමු වී ඇත.

දැනට ක්‍රියාත්මකවී ඇති වැඩසටහන් තුළින් ලබා ඇති අත්දැකීම වනුයේ බලගැන්වූ සිසු දිරිය සමාජ තුළින් කුසලතා සහ හැකියාවන් වර්ධනය[2] වූ, සාරධර්ම හා අගැයීම්වලින් පරිපූර්ණවූ, විනය ගරුක වූ, හා බලගැන්වූ නායකත්වයක් ගොඩ නැංවී ඇති බවත්, එම නායකයා වැදගත්වූ පණිවිඩයක් රැගෙන ප්‍රජා සංචාරයේ යෙදෙන හා ආකල්පමය වෙනසකට තුඩුදෙන විපර්යකාරකයෙක් සහ විරසක වී ඇති උතුර දකුණ යාකරන සාමදූතයෙක් බවට පත්වෙමින් පවතින බවයි.[3] තමන්ගේ දැනුම හා තමන්ට ලැබෙන තොරතුරු සම්බන්ධව තමන්ගේම ස්වාධීන අයිතියක් හා මතයක් ඇතිකර ගත හැකි, තමන්ට යහපත් යැයි සිතෙන සමාජ සම්බන්ධතා ඇතිකර ගැන්ම හා පවත්වාගෙන යාමේ පාලනය තමන්ටම හිමි, නිවැරදි හා යහපත් තීරණ කුමක්දැයි තමන්ටම එළඹිය හැකි තරුණ ශිෂ්‍ය සමාජ නායකත්වයෙන් යුතු සමාජ ජාලයක් නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ තුළින් ගොඩනැගෙමින් පවතී. යහපත් නායකත්වයක් මතුවී, පුහුණුවෙන් හා වර්ධනයයෙන් එය නැවත තමන්ගේම ප්‍රජාව දෙසට යොමු වුවහොත් ඔවුන් නියතයෙන් ම යහජීවනය ඒකාබද්ධතාවය, හා නිවැරදිභාවයේ පණිවිඩය තමන් දකින ආකාරයටම තම සමකාලීනයන්ට, තමන්ගේ පවුලට, තමන්ගේ ඥාතීන්ට, අසල්වාසීන්ට හා අවසානයේ සමස්ත ප්‍රජාවට ලබාදීමේ හැකියාවෙන් යුක්තය. ඔවුන් නායකත්වයේ යහපත් ලක්ෂණ අයත් වූවෝ පමණක් නොව එවැනි ලක්ෂණයන්ගෙන් යුක්ත ජාතික නායකත්වයන් හඳුනා ගත හැකි මෙන්ම, එය ආදර්ශයට ගත හැකි, හා අනුගමනය කරනු ලබන්නන් පිරිසක්ද වනු ඇති බව මේ වන විට වැඩසටහනේ විද්‍යාමාන වෙමින් පවතින ප්‍රතිඵලයන්ගෙන් පෙනී යයි.

## නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ හා සහජීවනය (Interethnic, social & religious hamony)

අන්තර් ජනවාර්ගික සහ ආගමික සහජීවනය වඩා වර්ධනය කොට තරුණ තරුණියන් අතර ගොඩනැගෙන අර්ථවත් සමාජ සම්බන්ධතා තුළින් සමාජ සංවර්ධනය ළඟා කර ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනට සම්බන්ධවූ ප්‍රතිලාභීන් විසින් නිර්මාණය කරණු ලැබූ නිසදැසක්, චිත්‍රයක් සහ 2009 සිංහල ද්‍රවිඩ අලුත් අවුරුද්ද වෙනුවෙන් සාදන ලද සාම්ප්‍රදායික ගැමි නිවෙස් දෙකක ඡායාරූපයක් පහතින් දැක්වේ. ඒ තුළින් අන්තර් ජනවාර්ගික හා ආගමික සහජීවනය උදෙසා තරුණ තරුණියන් තුළ පවතින ඇප කැප වීම මැනවින් තේරුම් ගත හැකිය.

**<u>අරුණෑල්ලක සුහද බවක්</u>**

අරුණෑල්ලක සුහද බවක්
සාමය සෙවනැල්ලක්
යුධ ගින්නට නැවතුමක්
ජාති වාදයට විසඳුමක්
තිබුන ද පුංචි අප සිත් තුළ
වී තිබුණි එය සිහිනයක් ව
අඳුරු සෙවනැලි තුළ ට
ආලෝකයක් නැත කිසිදු
දුක් ඇසීමට ජීවිතයේ
කෙනෙකු නැත පැමිණීමට පිහිටට
හෙට දවසත් මෙසේ ගෙවුනද
හදේ ඇත පුංචි බලාපොරොත්තුවක්
නැණ ගුණ වැඩුම: සිසු දිරිය
බලාපොරොත්තු දල්වන්නක් විය

2 පංතියේදී මම ළමයින්ගේ හිරිහැරවලට ලක් වෙනවා. ගුරුවරුන්ගෙන් බැනුම් අහනවා. ගුටි කනවා. මම හරි දඟයි. අකීකරුයි. වව්නියාව දෙමළ මහා විද්‍යාලයේ පැවති නැණ ගුණ වැඩුම: සිසු දිරිය වැඩසටහනකට සහභාගි වෙන්න කියලා අපේ පංතිය භාර ගුරුතුමා මට කිව්වා. මම බැහැ කිව්වා. දෙතුන් වතාවක්ම ගුරුතුමා මට යන්න කිව්වත් මම බැහැ කිව්ව නිසා ඔහු කිව්වා මට දඩුවම් කරනවා කියලා. ඒ නිසා අකමැත්තෙන්ම මට එම වැඩසටහනට සහභාගි වෙන්න සිදුවුණා. මුල් දින තුන ගත වන විට එම වැඩසටහන ගැන මට පුදුම ආශාවක් ඇති වුනේ. වැඩසටහන අවසානය වන විට මට ලැබුණු අත්දැකීම් දැනුම ආකල්ප කුසලතා නිසා මා තුළ සැබෑ වෙනසක් ඇති වුනා. දැන් හැමෝම මට ආදරය කරනවා. ඕනෑම අභියෝගයක් භාර ගැනීමට මා තුළ ආත්ම ශක්තියක් තියෙනවා. (2009.09.22 දින වව්නියාව පාවට්ටකුලම් ගනේෂ්වර මහා විද්‍යාලයේ නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ පිහිටු වීමේදී සිසුවකු කළ කතාවෙන් උපුටා ගන්නා ලදී.)


3 යුධ ගිනි දැල් අතරින් එබී බැලූ සරෝජිනී
නෙත් යොමා සිටියා මතක ද....
යාපනයේ අඳුරු කුටිය ළඟ
සුදු පරවියෝ තවත් ගැවසෙනවා ඇති....
තිස් වසරකින් පසු උදා වූ සාමයේ සුවඳ පැතිරුණා
උතුර දකුණ යා වුණා ....
ඉතින් සරෝජිනී
තල් වැට අතරින් රිංගා
යාපනයේ සුදු පරවියන් ඉගිලෙන හැටි
බලන්න ආසයි .....- සමිලා වින්ද්‍යා -


කැළඹුණු සිතට සිසිලසක් විය
එය ......
සිංහල දෙමළ මුස්ලිම්
තුළ දුරලිය භේදයන්
නැංවිය දක්ෂතාවයන්
කැළඹුණු සිත් සතන්
පහන් වී ගියහ
කුඩා සිත් තුළ
නව බලාපොරොත්තු ඇති විය

පදවි ශ්‍රී පුර, වැලිඔය, අ/සම්පත්නුවර මහා විද්‍යාලය, බී. ඉෂානි සෙව්වන්දි සිසුවිය විසින් අරුණැල්ලක සුහද බවක් යන්න තේමා කොට ලියූ නිසැදැසක් ඉහතින් දැක්වේ.

නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහනට මාසිකව සහභාගිවන තරුණ දරුවන් විසින් ඔවුන් විවේකිව ගත කරන අවස්ථාවලදී නිසදැස්, පද්‍ය, ගද්‍ය, චිත්‍ර වැනි ස්වකීය කුසලතා එකතුවක් නිර්මාණය කොට වැඩමුළුව අවසානයේ එළි දක්වයි. ඔවුනොවුන්ගේ අවශ්‍යතාව මත සිදු කෙරෙන නිර්මාණ එකතුවේ අඩංගු දෑ බොහොමයක් අන්තර් ජනවාර්ගික සහ ආගමික සහජීවනය පිළිබිඹුවීම අතිශයින් වැදගත් කරුණකි.

උදාහරණයක් ලෙසට, ඒකාබද්ධ සිසු සමාජ ජාලය විසින් පවත්වන ලද ප්‍රාදේශීය වැඩමුළුවකදී එක් සිසු සමාජ සාමාජිකයෙකු විසින් පහතින් දැක්වෙන වම්පස චිත්‍රය නිර්මාණය කර ඉදිරිපත්




කරන ලදී. එය අන්තර් ජනවාර්ගික හා ආගමික සහජීවනය උදෙසා රාජ්‍ය නායකත්වය සහ නැණ ගුණ වැඩුම: සිසු දිරිය ජාතික වැඩසටහන අතර පවතින සම්බන්ධතාව හා ඉටුකරන සම්මාදම මනාව පැහැදිලි කෙරේ. වියලී මැරී වැටෙන ශක්තිමත් වෘක්ෂයකට එලෙස විනාශ වන්නට ඉඩ නොදී ජලය සහ පොහොර වැනි අත්‍යවශ්‍ය දේවල් ලබා දීමෙන් නැවුම් අතුරිකිලි සාරවත්ව ප්‍රබෝධයකින් දළුලන අන්දම මෙම ශිෂ්‍යයා විසින් චිත්‍රයට නගා ඇත. දකුණු පස චිත්‍රය මගින් සාමය (Peace) දැනීම (Knowledge) ආදී ක්ෂේත්‍රයන්ට ත්‍රස්තවාදයෙන් සිදු කළ බලපෑම කදිමට පැහැදිලි කිරීමට උත්සහ ගෙන ඇත.

2009 අප්‍රේල් මස පැවැත්වූ සිංහල ද්‍රවිඩ අලුත් අවුරුද්ද වෙනුවෙන් ගොඩනගන ලද නිවෙස් දෙකක ඡායාරූපයක් ඉහතින් දැක්වේ. සාම්ප්‍රදායික සිංහල හා ද්‍රවිඩ ගැමි නිවෙස් සහ අදාළ නිවෙස්වල අලුත් අවුරුදු සමයේ සිදු කෙරෙන චාරිත්‍ර වාරිත්‍ර අවුරුදු උත්සවයට සහභාගිවූ තරුණ තරුණියන්ට දැක ගැනීමට අවස්ථාව උදාවිය. තිස්වසරක් තුළ බෙදී

වෙන්වී ගොඩනගා ගත් අනන්‍යතාවයන්ගේ අර්ථශූන්‍යභාවයත් සහජීවනයේ අසිරියත් තරුණ තරුණියන් තුළ නැවුම් හා ආකර්ශනීය අපේක්ෂාවන් ලෙස මල්ඵල ගැන්වූවාට කිසිඳු සැකයක් නැත.

මේ සියළු නිර්මාණයන්ගෙන් පෙනී යනුයේ සියළුම සිසු සමාජ ක්‍රියාකාරකම්වල පදනම අන්තර්වාර්ගික හා ආගමික සහජීවනය හා යථාර්ථාත්මකභාවය තහවුරු කෙරෙන ආකාරයෙන් වැඩසටහන තුළ අන්තර්ගත වී ඇති බවයි.



**නැණ ගුණ වැඩුම: සිසු දිරිය සමාජ හා නායකත්වය (Leadership)**

නායකයා යනු බලපෑමක් තුළින් වෙනසක් ඇතිකළ හැකි පෞරුෂයක් හා හැකියාවන් ගොඩනගාගත් පුද්ගලයෙක් වේ. මෙම බලපෑම සමහරවිට සමාජයේ අයහපත් ප්‍රතිඵලයන් සඳහාද සිදුවිය හැකිය. වෛරය, සැකය, අවිශ්වාසය හා පළිගැනීමේ ආකල්ප සහිතව ගොඩනැගුණ නායකයාට ප්‍රජාවට හා සමාජයට කළ හැකි හානිය මනුෂ්‍ය ඉතිහාසයේ විවිධ යුගයන්හදී නොමදව විද්‍යාමානවී ඇත. යහපත් නායකයාට ප්‍රජාවක් එකට එක්කොට ඒකාබද්ධව පවත්වාගත හැකි, පෙර සඳහන් කරන ලද ''අනුවේදනීය බන්ධනය'' ස්ථිරසාර ලෙස ස්ථාපනය කර පවත්වාගෙන යා හැක. අවිශ්වාසය හා සැකය හේතුකොටගෙන, එකී පොදු බන්ධනීයත්වය ගිලිහීගොස් සමස්ත ප්‍රජාවම විසන්ධිවී ඇති අවස්ථාවක එය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාවද යහපත් හා සාර්ථක නායකත්වයක් සතුවේ. නැණ ගුණ වැඩුම: සිසු දිරිය සිසු සමාජ මගින් සමාජයේ පහළම ස්තරයේ ප්‍රජා මට්ටමේදී ගොඩනැගෙමින් පවතිනුයේ එවැනි නායකත්වයකි. අවසානයේ එවැනි නායකත්ව ජාලාවක් හරහා සමස්ත සමාජ ඒකාබද්ධතාව ගොඩනැංවී සමාජ සංවර්ධනයේ අඩිතාලම සැකසීමේ කාර්යභාරයට ඔවුන් නියතයෙන්ම දායකවේ.

සිසු දිරිය සමාජ හරහා ගොඩනැගෙමින් පවතින නායකත්වය ආකල්පමය විපර්යාසයකට තුඩුදෙන ආකාරයේ නායකත්වයක් බව මේවන විටත් සනාථ වී ඇත. වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව දකුණ අධ්‍යාපන කළාපයේ තෝරාගත් පාසල්වල සිසු දිරිය සමාජ පිහිටවීමෙන් පසු තරුණ ශිෂ්‍ය නායක නායිකාවන් විසින් ප්‍රකාශ කරන ලද අදහස්වලින් ධ්වනිතවූ ආකල්පයන්ගෙන්ද ඒ බව මොනවට පැහැදිලිවේ (වගු අංක 2).

තරුණ ශිෂ්‍ය නායක නායිකාවන් අතරින් බහුතරයක් (64) සහජීවනය හා ඒකාබද්ධතාවය මත පදනම්වූ යහපත් සමාජයක් ගොඩනැංවීමේ කාර්යභාරයට කැපවීමෙන් දායකවිය යුතුය යන ආකල්පයෙන් සිටිති. එම ආකල්පය තමන්ගේ

**වගු අංක 2: සිසු දිරිය සමාජ පිහිටවීමෙන් පසු තරුණ ශිෂ්‍ය නායක නායිකාවන් විසින් ප්‍රකාශ කරන ලද අදහස්**

| | ප්‍රකාශකරණ ලද අදහස් හා අපේක්ෂාවන් | සිසු සංඛ්‍යාව | % |
|---|---|---|---|
| 01 | කුසලතා වර්ධනය කිරීම | 98 | 15.6 |
| 02 | අධ්‍යාපන ප්‍රගමනය | 101 | 16.1 |
| 03 | සාරධර්ම වර්ධනය හා යහපත් මානසිකත්වය ගොඩනැගීම | 59 | 9.4 |
| 04 | සහජීවනයෙන් සහ ඒකාබද්ධතාවයෙන් යුක්ත සමාජයක් ගොඩනැංවීම | 64 | 10.2 |
| 05 | සාමකාමී යහපත් සමාජයක් ගොඩනැගීම | 62 | 9.9 |
| 06 | වාදභේදයන්ගෙන් තොරව එකමුතුව ජීවත්වීම | 53 | 8.5 |
| 07 | අන්‍යෝන්‍ය අවබෝධය ගොඩ නැගීම සමෘද්ධිමත් දේශයක් ගොඩ නැගීම | 83 | 13.2 |
| 08 | යහපත් මානසිකත්වය ගොඩ නැගීම | 68 | 10.9 |
| 09 | නායකත්ව සංවර්ධනය | 32 | 5.1 |
| 10 | මෙම වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමට කැපවීම. | 7 | 1.1 |
| | මුළු ගණන | 627 | 100 |

සමකාලිකයන් අතර ව්‍යාප්ත කිරීමටත් ඔවුන් අරමුණ කරගෙන සිටිති, ඔවුන් ගැටුම් ප්‍රතික්ෂේප කරති. යහපත් හා ප්‍රගතිගාමී විපර්යාසයන් අරමුණු කරගත් නායකයා ගැටුම ප්‍රතික්ෂේප කරණ අතර නිරන්තරයෙන්ම අන්‍යයන්ගේ අදහස්වලටද ගරු කරන, සමතුලිතවූ සියළුම දෙනාම දිනන පොදු ස්ථාවරයක් ගොඩනගා ගැනීමට කටයුතු කරන්නෙකි. ඉහත වගුවෙන් දැක්වෙන අදහස්වලින් හා සිසු දිරිය ජාතික වැඩසටහන අනුරාධපුර පොලොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාර හා වව්නියා දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කිරීමේදී මේ වනවිට ලබා ඇති ක්ෂේත්‍ර අද්දැකීම්වලිනුත් පෙනි යන්නේ පෙර සඳහන් කළ ආකාරයේ ගැටුම ප්‍රතික්ෂේප කරන සහජීවනය හා ඒකාබද්ධතාවය ගරු කරන තරුණ නායකත්වයක් සිසු දිරිය සමාජ අතුරින් ගොඩනැගෙමින් පවතින බවයි.

**නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය හා හිමිකාරීත්වය (Ownership) පිළිබඳ අදහස**

තමන් විසින් තමන්ට අවශ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තමන්ගේම සම්පත් භාවිත කරමින් අවශ්‍යතැන්හි, අවශ්‍ය ආකාරයට, යෝග්‍ය ලෙස බාහිර සම්පත්ද උපකාර කරගනිමින් තමන්ගෙ "ම ක්‍රියාකාරී අන්තර්ගතය සහිතව ක්‍රියාත්මක වන බෙහොමයක් ප්‍රජා ව්‍යාපෘතීන් (Community Project) ඒ හේතුවෙන්ම තමන් තුළ ඇතිවන හිමිකාරත්වය (Ownership) පිළිබඳ හැඟීම නිසා ඉතා සාර්ථකවී ඇතිබව බොහෝ අධ්‍යයනයන් විසින් පෙන්වාදී ඇත (Schenck & Lonw, 1995; Korten & Klanss, 1984; Ponlton & Harris, 1988; Cernea, 1991;Gamlath, 2000;Chambers, 1984; Kortan, 1990; Liptan:...:) මෙවායේදී තදබල ලෙස අවධාරණය කරනු ලබන කාරණයවනුයේ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ භුක්තිවිඳින මූලික ප්‍රජා කොටස් ව්‍යාපෘතියේ ප්‍රධාන කෙන්ද්‍රය ලෙස සම්බන්ධකර ගැනීම ඉතා වැදගත් බවයි. එමගින්, ව්‍යාපෘතිය එක්තරා පිටස්තරයින් (Outsiders) කණ්ඩායමක් මගින් තමන්වෙත බලයෙන් පටවන ලද්දක් නොවේය යන හැඟීම ප්‍රජාව තුළ ඇති වේ. බලයෙන් ආරෝපණය කරන ලද්දක් යන අදහස ජනිත වුවහොත් එහිදී මෙය තමන්ගේ කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන ආ සමාජ හා සංස්කෘතික ජීවන ශෛලියට (Life Styles) කරනු ලබන පහරක් හෝ එසේත් නැතිනම්, අගෞරවයක් යන අදහස සමහර විට ඇතිවිය හැකිය. එමෙන්ම එය තමන්ට හුරුපුරුදු සමාජ දේහයට බලයෙන් බද්ධ කරීමට උත්සාහකරනු ලබන

ආගන්තුක දෙයක්ය යන හැඟීමද ඇතිවිය හැකි බව ඇතැම් විද්වතුන් සාක්ෂි සහිතව පෙන්වාදී ඇත (Chambers, 1984; Korten, 1990).

සිසු දිරිය සමාජ පිහිටුවීම සහ ප්‍රදේශිය සහ ජාතික මට්මේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම මුලික වශයෙන් නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය ජාතික වැඩසටහන ඔස්සේ ක්‍රියාත්මක වුවද සමස්ත වැඩසටහනේ කැපී පෙනෙන ලක්‍ෂණය වනුයේ සිසු සමාජ පිහිටුවීමෙන් පසු එහි කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන්ම සාමාජික තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පූර්ණ මැදිහත්වීමෙන් සිදුවීමයි. ඔවුන්ගේ අදහස් උදහස්වලට හා ඔවුන්ගේ 'හඬට' සවන්දීමේ වැදගත් ගුණාංගය නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය ජාතික වැඩසටහන සතුව පවතී. ඒ අනුව ප්‍රජා මට්ටමේ සිසු දිරිය සමාජ පිහිටුවීමෙන් පසු ජාතික වැඩසටහනේ සම්පත්දායකයින් එක්තරා ආකාරයක බාහිර උපකාරකයින් (Facilitators) පිරිසක් බවට පත්වේ. මේ දක්වා පිහිටුවා ඇති සිසු දිරිය සමාජ බොහෝමයක ක්‍රියාකාරකම් හා ක්‍රියාත්මක වීම දෙස සුපරික්‍ෂාකාරීව බලන විට මේ කාරණය මනාවට පැහැදිලි වේ. ප්‍රාදේශිය හා ජාතික මට්මමේ ප්‍රදර්ශන හා වැඩමුළු ආදී අවස්ථාවන්හිදී ප්‍රජා මට්ටමේ ශිෂ්‍ය නායක නායිකාවන් තමන්ගේ කුසලතා නිර්මාණ ආදිය එළිදැක්වීමේ වේදිකාවක් තමන් විසින්ම ගොඩනංවා ගන්නා බව සඳහන් වේ. මෙයින්ද පෙනී යන්නේ ප්‍රජා ශිෂ්‍ය නායක නායිකාවන් තුළ තමන් සම්බන්ධ වී ඇති ව්‍යාපෘතියේ හිමිකම තමන්ගේම යැයි යන ආකල්පයෙහි තදබල ලෙස කිඳා බැස ඇති බවයි.

සිසු දිරිය සමාජ කටයුතු නිරීක්‍ෂණය හා ඔවුන් සමඟ පැවැති සාකච්ඡාවන්ද, අංක 2 වගුවේ ඉදිරිපත් කරන ලද අදහස් උදහස්වලින්ද නැවතත් සනාථ වනුයේ ශිෂ්‍ය සමාජ නායක නායිකාවන් තුළ තමන් සම්බන්ධ වී ඇති කාර්යභාරයත්, එය නිර්මාණාත්මකව සැලසුම් කිරීමත් සහ සාර්ථකව ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමත් පිළිබඳ සැබෑ උනන්දුවක් හා අධිෂ්ඨානයක් ඇතිවී ඇති බවයි. මෙම කාරණය පැහැදිලි වීමෙන් පසු සිසු සමාජ පිහිටුවීමේ අවස්ථා බොහෝමයකදී, එය නැවත නැවතත් පරීක්‍ෂණයට භාජනය කිරීමෙන් පසුවද නියත වශයෙන්ම සනාථවූ කාරණය වුයේ ''නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය සමාජ යනු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේම, ඔවුන් විසින් ඔවුන් සඳහා පිහිටුවාගන්නා ලද ප්‍රජා ඒකකයන්'' බවයි.

අනික් අතට හිමිකාරත්වය පිළිබඳ හැඟීම ඇතිවීම හේතුවෙන් ප්‍රජා ව්‍යාපෘතීන්ගේ ස්ථිරසාර පැවැත්ම (Sustainability) නියතවශයෙන්ම තහවුරුවේ (Kenny, 2006; Ife, 2006). නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය සමාජ හරහා තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ඇතිවී ඇති උද්වේගකාරී හා අධිෂ්ඨාන පූර්වක වු උනන්දුව අභිප්‍රාය හා තම සමාජය එකිනෙක පරයා පවත්වාගෙන යාම සඳහා සියළුම සාමාජිකයින් විසින් කරනු ලබන ක්‍රියාශීලි දායකත්වය දෙස බලන විටද නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය සමාජ උතුරු නැගෙනහිර ගැටුම් හේතුවෙන් අසංවිධිතවූ දුෂ්කරතාවලින් ගහණ සමාජයේ දිගු ගමනක් අරඹා ඇති බව නියත වශයෙන්ම සඳහන් කළ හැක.

අනික් අතට සමස්ත ව්‍යාපෘතියේ ප්‍රධාන සංකල්පයක් ලෙස බලගැන්වීම (Empowerment) පෙර හඳුන්වාදුන් අතර බලගැන්වීම හා හිමිකාරීත්වය පිළිබඳ අදහස අන්‍යෝන්‍ය වශයෙන් වෙන්කළ නොහැකි ආකාරයට ඒකාබද්ධවන කාරණා ද්විත්වයක් වේ (Kenny, 2006; Schenck & Loum, 1990; Gamlath & Cox, 1997). සිසු දිරිය සමාජ තරුණ ශිෂ්‍යාවන් බලගැන්වීම හේතුවෙන්ම ඔවුන් අතර ඔවුන් කරන දෑ පිළිබඳ ඔවුන්ගේම හිමිකාරීත්වයක් තහවුරුවී ඇති අතර එය ඔවුන් තුළින් ඉවත් කිරීම බලගැන්වීමේ සංකල්පයට සෘජුවම ප්‍රතිපක්‍ෂ වේ. එය බලහීන කිරීමක් (Disempowerment) වීමට තුඩුදෙන්නක් විය හැක.

## නිගමනය

මුලාරම්භයේදීම සඳහන් කළ ආකාරයට, මෙම ලිපියේ අරමුණ වූයේ, ''නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය'' ජාතික වැඩසටහන, උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි, තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ''සිසු දිරිය'' සිසු සමාජ හරහා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විමසීමක යෙදීමයි. වැඩසටහනේ ප්‍රධාන අරමුණ වනුයේ සිසු සමාජ හරහා බිහිවන බලගැන්වූ තරුණ ශිෂ්‍ය නායකත්ව ජාලයක්

තුළින් අන්තර්වාර්ගීය, ආගමික සහජීවනය හා ඒකාබද්ධතාවය පිළිබඳ පණිවිඩය විවිධ ජන ප්‍රජා කොටස් වෙත ව්‍යාප්ති කර, එමඟින් යුක්ති ගරුක-විනයගරුක, බලගැන්වූ ප්‍රජා මූලයන් බිහි කිරීමත්, එමඟින් කෙරෙන දායකත්වය මඟින් සමස්ත සමාජයේ ප්‍රගමණයට හේතුවන සමාජ සංවර්ධනය තීව්‍ර කිරීමත් ය.

වැඩසටහන දැනට ක්‍රියාත්මක වන ආකාරයත්, මේ වනවිට විද්‍යාමාන වෙමින් පවතින ප්‍රතිලාභයන්ගෙනුත් පැහැදිලි වනුයේ ''ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ස්වේච්ඡා සහභාගීත්වයෙන් ගොඩ නැගෙන සිසු දිරිය සමාජ'' ඉහත කී අරමුණ දෙසට සාර්ථකව පිය නගන දිගු ගමන අරඹා ඇති බවයි. පටු ජාතිවාදී අදහස්වලින් කැඩී-බිඳී තිබූ ප්‍රජාව, යළි එක්තැන් වීමට හේතුවන ''අනුවේදනාත්මක සමාජ සම්බන්ධතා'' සොයා යාමේ ප්‍රයත්නය අරඹා ඇත. සියලු සමාජ හරහා බලගැන්වූ ස්වාධීන පෞරුෂයන්ගෙන් යුක්ත තරුණ ශිෂ්‍ය නායකත්වයක් බිහිවෙමින් පවතී. ඔවුන් සාමදූතයන් හෝ විපර්යකාරකයන් ලෙසට තමන් තුළ සිදු වූ විපර්යාසයේ පදනම ප්‍රජාව කරා ව්‍යාප්ත කරමින් සිටිති. සමස්ත වැඩසටහන තුළ තරුණ සිසු සමාජ, අඛණ්ඩව තහවුරු වෙමින් පවතින අතර ඔවුහු සමස්ත වැඩසටහනේ හිමිකරුවන් බවට පත්වෙමින් සිටිති. මූලික ප්‍රජා කොටස් හරහා සිදුවෙමින් පවතින ආකල්පමය, අදහස් උදහස්, විපර්යාසයන් මෙන්ම එසේ වෙනසක් සඳහා ක්‍රියාශීලීව සහභාගී වීමේ අවශ්‍යතාවය සහ එසේ සහභාගීවෙමින්, සිදුකළ හැකි විපර්යාසයන්ගේ යහපත් ප්‍රතිඵල පිළිබඳ පණිවිඩය, සමස්ත සමාජයේ ඉහළ ස්තරයන් හරහා විනිවිද වෙමින් පවතී. ශිෂ්‍ය ක්‍රියාකාරකම්, සාමූහික ප්‍රයත්නයන්, නිර්මාණ ආදිය සිසු සමාජ මෙන්ම ප්‍රාදේශීය මෙන් මාසික වැඩසටහන් හරහා ඉදිරිපත් වෙමින් උක්ත විපර්යාසයේ සාක්ෂි දෘෂ්‍යමාන කරමින් පවතී.

සමස්තයක් වශයෙන් මෙම ජාතික වැඩසටහන අත්හදා බැලීමක ප්‍රතිඵලයක් බවටද පැවසේ. අසීමිත කැපකිරීම, සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීම, විවිධ ආදර්ශයන් හඳුන්වාදීම, තරුණයන් උදෙසා තරුණයන් සතු සමාජ හා ජාතික වගකීම හා යුතුකම හඳුන්වාදීම වැනි අත්හදා බැලීම් ජාතික වැඩසටහන පසුබිමේ පවතින බව පැහැදිලිය. බලගැන්වීම, සහජීවනය, නායකත්වය හා හිමිකාරිත්වය සමාජ වගකීමක් ලෙස සාමූහිකව දැරීමටත්, විනයෙන් ශික්ෂණයෙන් හා නැණ ගුණෙන් පිරිපුන් තරුණ ශ්‍රමය ඵලදායී ලෙස සමාජ සංවර්ධනයේ ධාවක බලවේගය බවට පත් කිරීමත් යථාර්ථයක් වෙමින් පවතී. ඒ සඳහා රාජ්‍ය හා දේශපාලන නායකත්වය, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, නිළධාරීන්ගේ දායකත්වය මෙන්ම විද්‍යුත් හා මුද්‍රිත වැඩසටහන් සතු කාර්යභාරයද මෙහිලා වැදගත්ය. ජීවන නිපුණතාවය පරිසර හා ආපදා කළමනාකරණ පුහුණුව ඇතුළු යෝග්‍ය ක්ෂෙත්‍ර හා විවිධ අංශ නැණ ගුණ වැඩුමඃ සිසු දිරිය සමාජ සඳහා ඒකාබද්ධ කිරීමෙන් ජාතික වැඩසටහනේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී පහසු වනු ඇත. දැනුම වඩා වර්ධනය කොට යහපත් ආකල්ප සාධනය වීමෙන් තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හැසිරීම යහපත් වනවා පමණක් නොව අලුත් ශ්‍රී ලංකාවකට එය මූලික හා ශක්තිමත් පදනමක් සපයනු ඇත. තවද විද්‍යාත්මක හා ප්‍රායෝගික විශ්ලේෂණයන්, ගවේශනයෙන් හා පර්යේෂණයන් මඟින් ඊට අවශ්‍ය සහ යෝග්‍ය ගුණාත්මක හා ප්‍රමාණාත්මක වටපිටාව නිර්මාණය වනු නොඅනුමාන ය.

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි:**


Anderson, H. & L.B. Kasperson (2000) *Classical and Modern Social Theory*, London: Blackwell

Bauman, Z. (2001) *Community: Seeking Safety in an Insecure World*, Cambridge:Polity Press

Etzioni, A. (1995) *The Spirit of Community*, London: Fontana.

New Communitarian Thinking: Persons, Virtues, Institutions and Communities. (1993). Charlottesville: University Press of Virginia.

Huges, P. et. al. (2006) *Building Stronger Communities*, Sydney NSW: UNSW

Ife, J. & F. Tesriero (2006) *Community Development: Community-Based Alternatives*

*in an Age of Globalization*, French Forest NSW: Pearson Education Australia

Kenny, S. (2006) *Developing Communities for the Future*, Melbourne:Thomson.

Schnck, C.J. & H. Louw (1995) "A People-Centred Perspective on People-Centred Community Development". *Journal of Social Development in Africa* 10 (2), 81-91

UNDP (1996) Human Development Report, Newyork: Oxford University press

Wijesinghe, N. (2006) *Nana Guna Vaduma: Sisu Diriya*, Unpublished Project Document, Colombo: Presidents' Office